මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# <u>**පුවත්පත් නිවේදනය**</u>

## <u>**යූරියා පොහොර මිලදී ගැනීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 55ක ණය පහසුකමක්**</u>

ශ්‍රී ලංකා රජයේ හදිසි ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් යූරියා පොහොර මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකාවට ඇමරිකානු ඩොලර් මිලියන 55ක ණය පහසුකමක් ලබා දීමට ඉන්දියානු රජය තීරණය කරන ලදී. මේ අනුව ශ්‍රී ලංකා රජය සහ ඉන්දියාවේ එක්සිම් බැංකුව විසින් එයට අදාළ ගිවිසුම අද දින (2022 ජූනි 10) කොළඹ දී අත්සන් තබන ලදී. එම අවස්ථාවට ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා, කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතා සහ ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා සහභාගී වූහ. තව ද ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙක් ද මෙම අවස්ථාවට එක් වූහ.

2. මෙම ණය පහසුකම දැනට වගා කෙරෙන යල කන්නය සඳහා අවශ්‍ය පොහොර සපයා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයට අවස්ථාව ලබා දෙනු ඇත. මෙම තීරණාත්මක අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් යූරියා පොහොර කෙටි කාලයකදී ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා සියලු කටයුතු කඩිනමින් සිදු කිරීමට ශ්‍රී ලංකා රජය සහ එක්සිම් බැංකුව එකඟ වී ඇත. ගිවිසුම් අත්සන් තැබීමේ උත්සවයේදී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා අවශ්‍ය අවස්ථාවේදී සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් ඉන්දීය රජයට සිය කෘතවේදීත්වය පළ කර සිටියේය. ඉතා ඉක්මනින් මෙම ණය පහසුකම අත්සන් තැබීම තුළින් ඉන්දියානු රජය ශ්‍රී ලාංකික ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් දක්වන වැදගත්කම පිළිඹිබු වන බව මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේය.

3. ඉන්දියාවේ අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තිය අනුව සහ ශ්‍රී ලංකාවේ දයාබර මිතුරකු සහ සහකරුවකු වශයෙන් ඉන්දියාව පසුගිය මාස කිහිපයේදී ශ්‍රී ලාංකික ජනතාවට විවිධ අයුරින් සහයෝගය ලබා දී ඇත. ආහාර ද්‍රව්‍ය, ඖෂධ, ඉන්ධන සහ භූමිතෙල් වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සපයමින් ආහාර, සෞඛ්‍ය සහ බලශක්ති සුරක්ෂිතතාවය ළඟා කර ගැනීම සඳහා

ඇමරිකානු ඩොලර් බිලියන 3.5කට ආසන්න ආර්ථික සහයෝගයක් ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබා දී ඇත.

***

කොළඹ
2022 ජූනි 10